**මිනුවන්ගොඩ නගර සභාව - 2023**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 අහිතකර මතය

මිනුවන්ගොඩ නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට මිනුවන්ගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අහිතකර මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිතියේ අංක 3.28 ප්‍රකාරව හා එහි පරිශිෂ්ඨය 2 හි පහදාදීම් හා මහපෙන්වීම් හි EG 6.2 ප්‍රකාරව මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේ අතිරික්තය සඳහා සිදුකළ යුතු ගැලපීම්වල දී දිගුකාලීන ණය ගැණුම් පිරිවැය වූ රු. 259,512ක් නැවත ගලපා නොතිබුණු අතර රු. 3,892,404 ක ගැලපුම කුමක්ද යන්න අනාවරණය නොවිය | පිළිගනිමි. | ප්‍රමිතිය ප්‍රකාරව මුදල් ප්‍රවාහය පිළියෙල කළ යුතුය. |
| (ආ) | ප්‍රමිතියේ අංක 3.29 හා එහි පරිශිෂ්ඨය 2 හා පහදාදීම් හා මහපෙන්වීම්හි EG 6.3 ප්‍රකාරව ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ස්ථාවර තැන්පතුවල මුදලින් කළ ආයෝජන රු. 27,000,000ක් දක්වා නොතිබුණු අතර වර්ෂය තුළ දී ලැබූ පොළී ලෙස රු. 5,424,917 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2024.12.31 දිනට අවසන් ගිණුම් සමඟ නිවැරදි කර ඉදිරිපත් කරන බව. | ප්‍රමිතිය ප්‍රකාරව මුදල් ප්‍රවාහය පිළියෙල කළ යුතුය. |
| (ඇ) | ප්‍රමිතියේ අංක 3.30 ප්‍රකාරව හා එහි පරිශිෂ්ඨය 2 හි පහදාදීම් හා මහපෙන්වීම් හි EG 6.4 ප්‍රකාරව මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහ ගණනය කිරීමේදී ලැබිය යුතු ප්‍රාග්ධන වියදම් ප්‍රදාන වටිනාකම වූ රු. 2,588,613ක් ලද ප්‍රාග්ධන ප්‍රදාන ලෙස දක්වා තිබුණු අතර දිගුකාලීන ණය සඳහා ගෙවූ පොළී වටිනාකම රු. 218,223 ක් දක්වා නොතිබුණි . | 20243.12.31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නිවැරදිව ගිණුම් ගත කිරීමට සටහන් කර ගත් බව. | ප්‍රමිතිය ප්‍රකාරව මුදල් ප්‍රවාහය පිළියෙල කළ යුතුය. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ලැබී තිබුණු ගලි රථ ගාස්තු රු. 323,990 ක් හා සමාලෝචිත වර්ෂයට අදාළව ලැබී තිබුණු රු. 1,735,640 ක් පෙර වර්ෂවල හා සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට මිශ්‍ර තැන්පත් ගිණුමට බැර කර තිබුණි. | පිළිගනිමි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | 2022 හා 2023 වර්ෂයන්ට අදාළව ලැබී තිබුණු නව කඩ කාමර පෙර මුදල් ආදායම් පිළිවෙලින් රු. 19,200,000 ක් සහ රු. 11,497,500 ක් ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට මිශ්‍ර තැන්පත් ගිණුමට බැර කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර තැන්පත් පොලි ආදායම රු.5,445,455 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු ශේෂය රු. 32,424,917 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සමාලෝචිත වර්ෂය සඳහා ලැබුන ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු. 100,166,260 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඊ) | 2023 දෙසැම්බර් 31 දිනට ගෙවා අවසන් ව්‍යාපෘති 08ක් සඳහා රු. 1,712,174 ක ගෙවිය යුතු ප්‍රතිපාදන සඳහා වෙන්කිරීම් කර තිබුණි. | -එම- | -එම- |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 14ක මූල්‍ය ප්‍රකාශ අනුව ශේෂ සහ උපලේඛනවල එකතුන් අතර රු.74,263,303 ක්වූ නොසැසඳුණු වෙනසක් පැවතුණි. | පිළිතුරු සපයා නැත. | වෙනසට හේතු සොයා නිවැරදි කර ගත යුතුය. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | හිඟ හිටි වෙළඳපොළ ගාස්තු | 416,610 | විස්තරාත්මක උපලේඛන | 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය වෙනුවෙන් වූ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන බව | උපලේඛන නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සෘජු බැංකු ප්‍රේෂණ 2023/11/30 දිනට ශේෂය | 2,257,242 | විස්තරාත්මක උපලේඛන | -එම- | -එම- |
| (ඇ) | සවිකිරීම් | 4,275,353 | විස්තරාත්මක උපලේඛන | -එම- | -එම- |
| (ඈ) | පරිගණක මෘදුකාංග | 70,849 | විස්තරාත්මක උපලේඛන | -එම- | -එම- |
| (ඉ) | පාරවල් හා බෝක්කු | 51,210,447 | විස්තරාත්මක උපලේඛන | -එම- | -එම- |
| (ඊ) | දිගුකාලීන ණය පොලී | 671,591 | තහවුරු ලිපි | -එම- | -එම- |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනත VII වන පරිච්ඡේදයේ 38(2) වගන්තිය | මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන බවටත් එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳ කලින් කළ සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකර ඇති බවටත් ප්‍රධාන ගණන් දීමේ නිලධාරි විසින් ඉටුකළ යුතු ලිඛිත සමාලෝචනයේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2024 වර්ෂයේ සිට ලිඛිත සමාලෝචනයේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කරන බව. | යොමුගත පනතේ වගන්තිය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | නගර සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති 322 | රීතියේ විධිවිධානවලට පටහැනි ලෙස කඩ කාමර 4 ක් බදු දීම සඳහා සභාපති, උප සභාපති හා මන්ත්‍රීවරුන් 5දෙනෙකු ගෙන් සමන්විත ටෙන්ඩර් කමිටුවක් පත් කර තිබුණි. | ටෙන්ඩර් කමිටුව මේ වන විට පත්කර වාර්ෂිකව ලංසු කැඳවීම් සිදුකරන බව. | යොමුගත රීතිය අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104(3), 110 | 2022 මැයි 09 දින රටෙහි සිදුවූ කළහකාරී තත්ත්වය මත සභාවේ සභාපතිවරයාගේ නිවස ගිනි ගැනීම හේතුවෙන් රාජකාරි පරිහරණයට ලබාදුන් ලැප්ටොප් පරිගණකය, ඩොන්ගලය හා දත්ත ගබඩා උපාංගය විනාශවීම වෙනුවෙන් රු.311,390 ක් වූ අලාභයට වගකිව යුතු පාර්ශ්වය හඳුනාගෙන අලාභය අයකර ගැනීමට හා අලාභ පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත ලිපියක් ප්‍රාරම්භක වාර්තාව සමඟ ඉදිරිපත් කර ඇති බව. | යොමුගත මුදල් රෙගුලාසිය අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය VIII වැනි පරිච්ඡේදයේ 9:1 | විධිමත් පත්වීමක් නොමැති වැඩ බලන නිලධාරියකු වෙත 2022 සැප්තැම්බර් මාසයේ සිට 2023 ජූලි මාසය දක්වා නිවාඩු දින වැටුප් ලෙස රු.121,827ක් ගෙවා තිබුණි. | මේ දක්වාම එම අනුමැතිය ලැබී නොමැති බව. | යොමුගත පරිච්ඡේදයට අනුකූල විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2009 ජුනි 17 දිනැති අංක 09/2009(I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වැඩබලන ලේකම් විසින් 2023 ජනවාරි සිට ජූලි දක්වා වැඩ කරන දින 141 ක් අතරින් දින 90 ක් සඳහා පමණක් ඇඟිලි සලකුණු යන්ත්‍රයෙහි පැමිණීමත් පිටවීමත් සටහන් කර තිබුණි. | වැඩ බලන ලේකම් විසින් පැමිණීමේ හා පිටවීමේ ලේඛනය පවත්වාගෙන ගොස් ඇති බව. | යොමුගත චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2016 නොවැම්බර් 9 දිනැති අංක LGD/13/2016 දරන පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | 2015 වර්ෂයේ තක්සේරුවෙන් පසු නව තක්සේරුව සඳහා වසර 7 ක් ගතවීම හේතුවෙන් සණස ක්‍රීඩම් පාර්ක් වෙළඳ සංකීර්ණයේ කඩකාමර වලින් නව තක්සේරු අගයන් හා සැසඳීමේදී වර්ෂ 4ක් වෙනුවෙන් දළ වශයෙන් රු.2,510,400ක කුළී ආදායමක් අහිමි වී තිබුණි. | සභාව සතු කඩකාමර සඳහා වසර තුනකට වරක් රජයේ තක්සේරුව ලබා ගැනීමටත්, අදාල තක්සේරු ක්‍රියාත්මක කිරීමටත් සැලසුම් කර ඇති බව. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.13,239,491ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.26,580,197ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 20 ,751 | 20, 346 | 16, 900 | 13, 351 | 20, 515 | 20, 474 | 14, 319 | 14, 577 |
| කුලී | 67 ,006 | 22, 417 | 21, 298 | 2, 657 | 40, 675 | 29, 640 | 27, 326 | 2, 370 |
| බලපත්‍ර ගාස්තු | 901 | 367 | 442 | 16 | 846 | 723 | 686 | 37 |
| වෙනත් ආදායම් | 31 ,525 | 11,610 | 11, 610 | - | 24, 925 | 31, 957 | 31, 957 | - |
| | 120,183 | 54,740 | 50,250 | 16,024 | 86,961 | 82,794 | 74,288 | 16,984 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | **වරිපනම්** | | |
| (අ) | 2023 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 1ක සිට වර්ෂ 8 ක් දක්වා වූ කාල පරාසයක පැවති රු. 50,000ට වැඩි වරිපනම් ඒකක 32ක හිඟ වරිපනම් එකතුව රු. 3,236,036ක් විය. | 2023.09.30 දින සිට 2023.12.31 දින වන විට හිඟ ප්‍රමාණය අඩු වී ඇති අතර කාර්තුව අවසානයේ හිඟ මුදල අඩු වී සංශෝධනය වී ඇති බව. | හිඟ ආදායම් අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඉතිරි වරිපනම් හිඟය රු. 9,090,211 ක් වූ අතර වර්ෂ 05කට වැඩි රු. 4,300,436ක හිඟ ශේෂය අයකර ගැනීම සඳහා හෝ දේපළ තහනම් කිරීම සඳහා සභාව විසින් කටයුතු කර තිබුණු බවක් අනාවරණය නොවීය. | ආදායම් අය කිරීම පහත මට්ටමක පැවති අතර දේපළ තහනම් කිරීමේ කටයුතු සිදු කර හිඟ මුදලින් රු.635322.ක මුදලක් සභාවට අයකරගෙන ඇති බව. | හිඟ ආදායම් අය කිරීමට කටයුතු කළ යුතුය. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරන ගැසට් නිවේදනයේ "ඇ" කොටස අනුව පරිසර බලපත්‍ර ලබාගත යුතු ලෙස සභාව විසින් 2023 සමීක්ෂණ වාර්තාව අනුව හඳුනාගත් ආයතන 5 ක් සඳහා විගණිත දින වන 2023 සැප්තැම්බර් 01 දින වන විටත් පරිසර බලපත්‍ර ලබාදීමට කටයුතු කර නොතිබුණු අතර පරිසර බලපත්‍ර ලබා ගත යුතු ආයතන සියල්ලම හඳුනාගැනීම අවසන් කර ද නොතිබුණි. | 2023 වර්ෂයට අදාළ සමීක්ෂණ 2023.09.01 දින වන විට අවසන් වී නොතිබූ අතර මේ වන විට අවසන් වී ඇති බව. | පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන සියල්ලම හඳුනාගැනීමට සමීක්ෂණ සිදු කළ යුතුය. |
| (ආ) | නගර සභා ආඥා පනතේ 164 (4) අනුව 164 වගන්තියට පටහැනි ලෙස 2023 දෙසැම්බර් 31 දින වන විට වෙළඳ බලපත්‍රයක් නොමැතිව ආයතන 33ක් ද ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු නොගෙවූ ආයතන 69ක් ද ව්‍යාපාර කටයුතු සිදු කරමින් පැවතුණි. | වෙළඳ බලපත්‍ර නොගෙවූ ආයතන 5 ආදායම් පරීක්ෂක විසින් අයකර ගැනීමට හැකි ආයතන ලෙස හඳුනාගෙන 2024 වර්ෂයේ ජනවාරි 31 වන විට අයකර ගැනීමට කටයුතු කර ඇති බව. | නගර සභා ආඥා පනතේ අදාළ වගන්තිය අනුව කටයුතු කළ යුතුය.. |
| (ඇ) | ආයතන දෙකකට අදාලව ප්‍රචාරණ දැන්වීම් පුවරු 17 කින් පුවරු 8 කට ගාස්තු අයකර නොතිබුණි. | 2024 දැන්වීම් පුවරු සඳහා වර්ෂයට අදාළ ගාස්තු ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | නිවැරදිව සමීක්ෂණය සිදු කර ගාස්තු අය කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිව්හැම් පාර ආරම්භවන ස්ථානයේ පිහිටා ඇති සභාවට අයත් රථගාල බදු පදනම මත ලබා දී තිබුණු 2019 වර්ෂයේදීම බදු ගැණුම්කරු එම ස්ථානයේ තාවකාලික කඩ කාමර 10 ක් ඉදිකර 2020 වර්ෂයේ සිට වර්ෂ 3 ක කාලයක් සඳහා වෙනත් අය වෙත බදු පදනම මත ලබා දී තිබුණ ද ගිවිසුම් ප්‍රකාරව සභාව ඊට එරෙහිව කටයුතු කර නොතිබුණි. | කඩ කාමරබදු දීම සඳහා ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය වසර 03 කට පමණක් හිමිව ඇති බැවින් නැවත ගිවිසුම්ගත වීමක් සම්බන්ධයෙන් පැන නැගුණු ගැටළුකාරී තත්ත්වය මත ගිවිසුම්ගත වීම සම්බන්ධ කරුණු තාවකාලිකව නතර කරන ලද බව. | ගිවිසුම් ප්‍රකාරව කළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභාවේ කායවර්ධන මධ්‍යස්ථානය සඳහා ජිම් කාපට් මිලදී ගැනීමේදී තොරා ගෙන තිබූ ආයතනය ලබා දී තිබුණු මිල ගණන් අනුව අඩි 2 x 2 (මි.මී.10) ප්‍රමාණයේ ජිම් කාපට් එකක මිල රු.4,950ක් බව අනාවරණය වූ අතර එම ආයතනය වෙත සභාව විසින් වර්ග අඩි 1ක් රු.1,100 බැගින් වර්ග අඩි 1063.9ක් සඳහා රු.1,170,290 ක් ගෙවා තිබුණි. එහෙත් විගණනය විසින් එම ආයතනයෙන් ලිඛිතව ලබාගන්නා ලද මිල ගණන් අනුව වර්ග අඩි 1ක මිල රු.792 ක් වූයෙන් සභාව වර්ග අඩි 1කට රු.308 ක් බැගින් (රු.1100 - රු.792) වර්ග අඩි 1063.9ක් සඳහා රු.327,681ක් වැඩිපුර ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. | සැපයුම්කාර පාර්ශවය ඉදිරිපත්කළ මිල ගණන් 2023.03.07 දින විවෘත කරන ලදි. පසුව ඔවුන් ලබා දුන් මිල ගණන් වෙනස්වීම මත සභාව වැඩිපුර ගෙවා තිබීම ගැටළු සහගත බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභාවෙන් බැහැරට ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අයවිය යුතු රු. 617,521 ක්, මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු. 270,644 ක් , කවදා සිට පැවත එන ශේෂයක් ද යන්න දක්වා නොතිබුණු විශ්‍රාම ගිය නිලධාරීනියෙකුගෙන් අයවිය යුතු වූ රු. 153,339ක්, 2022 වර්ෂයේදී වැඩ තහනම් කර තිබූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 177,135 ක් හා සේවය අතහැර ගිය නිලධාරීන් 3 දෙනෙකුගෙන් අයවිය යුතු රු.336,054 ක් සමාලෝචිත වර්ෂය තුලදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගනිමින් පවතින බව. | හිඟ ණය ශේෂ අයකර ගත යුතුය. |